**ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය**

**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**

**නීති අධ්‍යාන දෙපාර්තමේන්තුව**

**නීතිවේදී උපාධි පාඨමාලාව - 6 වන මට්ටම**

**අවසාන පරීක්ෂණය - 2020/21**

**විවෘත ග්‍රන්ථ පරීක්ෂණය ( OBT )**

**LLU 6716/LWU4324- වාණිජ නීතිය**

**කාලය - පැය තුනයි (03 )**

---

**දිනය - 2021 සැප්තැම්බර් 10** **වේලාව - පෙ.ව. 9.30 – ප.ව.12.30**

---

**මුලු ප්‍රශ්න ගණන - පහයි (5).**

**ප්‍රශ්න හතරකට (4) පමණක් පිළිතුරු සපයන්න.**

**අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.**

1. නිසල්, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම මූල්‍ය සමාගමක් වන කොල්සන් සමාගම වෙතින් 2021 අප්‍රේල් මස 10 වන දින ඇති කර ගත් කුලී සින්නක්කර ගිවිසුම ප්‍රකාරව මෝටර් රථයක් කුලියට ගත්තේ ය. මූලික තැන්පතුව ලෙස රු. 800,000/- ක මුදලක් ගෙවීමට නිසල් එකඟ වූ අතර පොලිය ද සමඟ ඉතිරි රු. 3,600,000/- ක මුදල මාසික වාරික 60 කින් ගෙවීමට එකඟ වූවේ ය. පිළිවෙළින් වාරික දෙකක් ගෙවීමෙන් අනතුරුව, රථය දෝශ සහගත තත්ත්වයක පවතින බව දැනගැනීම හේතුවෙන් තවදුරටත් ගෙවීම නතර කළ නිසල් වාහනය ප්‍රතික්ශේප කිරීමට වන ඔහුගේ අදහස 2021 ජුනි මස 30 වන දින ලිපිය මඟින් දැනුම් දුන්නේ ය.

   සති දෙකක පමණ කාලයක් ඇතුළත කොල්සන් සමාගම වාහනය පවරා ගත් අතර මෝටර් රථයේ පහත දෝශ පවතින බවට හඳුනා ගත්තේ ය.

   a) ගිවිසුමට එළඹීමෙන් අනතුරුව ඔඩෝමීටරයේ දුර සීමාව(millage) නැවත සකස් කිරීම;
   b) දිශානතිය පෙන්වන තැටිය (Navigation disk) නොමැති වීම ;
   c) ධාවනයේ දී අමුතු ශබ්දයක් ඇසීම ;

d) වින්ඩ්ස්ක්‍රීනයේ ඉරිතලා යෑම් තිබීම ; සහ

e) තිරිංග පද්ධතියේ දෝශ

මෝටර් රථය කුළියට ගැනීමට පෙර නිසල් විසින් ධාවක පරීක්ෂණයක් (test drive) කර තිබුණු බැවින් කොල්සන් සමාගමේ මතය වන්නේ කාර් රථයේ කිසිඳු දෝශයක් සඳහා සමාගම වග නොකියන බවත් ඉහත හඳුනාගත් සියලුම දෝශ සඳහා නිසල් සම්පූර්ණයෙන්ම වග කියන බවත් ය. තවදුරටත්, කොල්සන් සමාගම අලුත්වැඩියාව සඳහා වැයවූ වියදම් නිසල් වෙතින් ඉල්ලා සිටියි.

නිසල් විශ්වාස කරන්නේ ඔහු විසින් වලංගු පරිදි කුළි සින්නක්කර ගිවිසුම අවසන් කර ඇති බැවින් ඔහු විසින් දැනටමත් කොල්සන් සමාගමට ගෙවන ලද මූලික තැන්පතුව සහ මාස දෙකේ වාරික මුදල් ඔහුට අයකර ගත හැකි බවයි.

ශ්‍රී ලංකාවේ 1982 අංක 29 දරන පාරිභෝගික ණය පනතේ අදාළ ප්‍රතිපාදන සහ අදාළ නඩු තීන්දු ඇසුරෙන් පාර්ශවයන්ට උපදෙස් දෙන්න.

(ලකුණු 25)

2. කොවිඩ් -19 නිසා ඇතිවන ව්‍යසනකාරී සෞඛ්‍ය බලපෑම මධ්‍යයේ බොහෝ වෛද්‍ය, ශල්‍යකර්ම සහ රෝහල්ගත කිරීමේ වියදම් ආවරණය කරමින් සුබ්‍රමනියම් විසින් කියෝරෝ රක්ෂණ සමාගමෙන් රු. 500,000/- වටිනා සෞඛ්‍ය රක්ෂණ ආවරණයක් ලබා ගැනීමට කැමති වූවේය. සුබ්‍රමනියම්ට මෙම සමාගම හඳුන්වා දෙනු ලැබුවේ කියෝරෝ සමාගමේ නියෝජිතයෙකු වන අජන්ත විසිනි.

සමාගම විසින් ඉංග්‍රීසි භාෂාවෙන් කෙටුම්පත් කරන ලද මුද්‍රිත යෝජනා පත්‍රයේ රක්ෂණ අයදුම්කරු විසින් " සම්පූර්ණයෙන්ම සහ පැහැදිලිවම තමන්ගේම අත් අකුරෙන්" පිළිතුරු ලබා දිය යුතු ප්‍රශ්න ගණනාවක්ම අන්තර්ගත විය. ඒ හා සමාන අවශ්‍යතාවයක් සමාගම විසින් නිර්දේශ කළ වෛද්‍යවරයෙකු ඉදිරිපිට ඔහු සම්බන්ධයෙන් කරන පර්ක්ෂණයේ දී යොමු කරන "පුද්ගලික ප්‍රකාශයේ" ඇතුළත් ප්‍රශ්න හා අදාළ පිළිතුරු සම්බන්ධයෙන් ද ඇත. සුබ්‍රමනියම්ට ඔහුගේ නම ඉංග්‍රීසියෙන් අත්සන් කිරීමට හැකි වූව ද ඒ හැරුණු විට ඔහුට එම භාෂාව සම්බන්ධව දැනීමක් නැත. යෝජනා පත්‍රයේ වන ප්‍රකාශ සුබ්‍රමනියම්ට ද්‍රවිඩ භාෂාවට පරිවර්තනය කර පැහැදිලි කරනු ලැබුවේ අජන්ත විසින් වන අතර එය පුරවන ලද්දේ ද අජන්ත විසිනි. සුබ්‍රමනියම් විසින් යෝජනා පත්‍රයේ පහතින් සිංහල සහ ඉංග්‍රීසී භාෂාවලින් සඳහන්ව තිබූ,

"යෝජනා පත්‍රයේ ඇති සියලු ප්‍රකාශ ගිවිසුමේ පදනම විය යුතු ය" යන මුද්‍රිත ප්‍රකාශය ඔහු අත්සන් කළේ ය. පුද්ගලික ප්‍රකාශය ද ඉංග්‍රීසි භාෂාවෙන් මුද්‍රණය වී තිබුණු අතර වෛද්‍ය පරීක්ෂණයෙන් පසුව නිර්දේශ කළ වෛද්‍යවරයෙකු ඉදිරිපිට දී භාෂා ද්විත්වයෙන් ම ඔහු එය අත්සන් කළේය.

පුද්ගලික ප්‍රකාශයේ සඳහන් වන්නේ සුබ්‍රමනියම්ගේ සෞඛ්‍ය තත්ත්වය ඒ හා සමාන වයසේ සිටින සෞඛ්‍ය සම්පන්න පුද්ගලයන්ගේ මෙන් සම්පූර්ණයෙන්ම යහපත් තත්ත්වයේ පවතින බව යි. සමාගම ඔහුගේ යෝජනා පත්‍රය අනුමත කර තිබිණි.

පහත දැක්වෙන්නේ එම යෝජනා පත්‍රයෙන් කොටසකි.

" 1. ඔබට කවදා හෝ උණ සන්නිපාතය, ඉන්ෆ්ලුවන්සා, පාදයේ බරවා තත්ත්වයක් හෝ වෙනත් යම් උණ තත්ත්වයක් යන රෝග වැළඳී තිබේ ද?

2. ඔබව ඔබගේ නිවසටම සීමා නොකළත් ඉහත සඳහන් කළ රෝග සඳහා පසුගිය වසර පහක කාලය තුළ ඔබ විසින් යම් වෛද්‍යවරයෙකුගෙන් වෛද්‍ය උපදෙස් ලබා ගෙන තිබේ ද? එසේ වෛද්‍ය උපදෙස් ලබා ගත්තේ නම්, අදාල විස්තර, එම වෛද්‍යවරයන්ගේ නම්, සහ ලිපිනයන් දක්වන්න."

යෝජනා පත්‍රයේ සඳහන් ඉහත ප්‍රශ්න දෙක සඳහා " නැත " යනුවෙන් සඳහන් කර තිබුණ ද සුබ්‍රමනියම් පසුගිය වසරේ දී ඩෙංගු රෝගයෙන් පීඩා විඳ තිබිණි. රක්ෂණ ආවරණ පත්‍රය ලැබී මාස දෙකකින් අනතුරුව සුබ්‍රමනියම්ට කොවිඩ් 19 රෝගය වැළඳුන අතර ඔහු දින 14 ක කාලයක් පුද්ගලික රෝහලක රැඳී සිටියේ ය. රක්ෂණ ආවරණය යටතේ රෝහල් ගාස්තු ඉල්ලා සිටිය විටදී කියෝරෝ සමාගම එම ඉල්ලීම ප්‍රතික්ශේප කළේ සුබ්‍රමනියම් විසින් රක්ෂණ ගිවිසුම කඩ කර ඇත යන හේතුව සඳහන් කරමිනි.

සුබ්‍රමනියම්ගේ නෛතික තත්ත්වය සහ ඔහුට ලබා ගත හැකි යම්කිසි සහනයක් වෙත්නම් ඒ සම්බන්ධව ඔහුට උපදෙස් දෙන්න.

අදාළ නඩු තීන්දු ඇසුරෙන් ඔබගේ පිළිතුර සනාථ කරන්න. (ලකුණු 25)

3. “ජාතික රෙගුලාසි සහ අන්තර්ජාතික නිර්දේශයන්ට අනුකූලව ජාතික ආහාර ආරක්ෂා කිරීමේ පාලන පද්ධති සම්බන්ධයෙන් වගකීම් සහිත නිසි බලධාරී ආයතන වෙත සාමාන්‍ය ක්‍රියාකාරකම් සහ කටයුතු අඛණ්ඩව කරගෙන යෑම සඳහා පවත්නා කොවිඩ් 19 වසංගත තත්ත්වය සුවිශේෂී සහ පෙර නොවී විරූ ආකාරයේ අභියෝග ඉදිරිපත් කර ඇත.”

***එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (2020)***

ඉහත ප්‍රකාශය ඇසුරෙන්, කොවිඩ් 19 වසංගත තත්ත්වය යටතේ නිර්මාණය කර ඇති නව සාමාන්‍ය තත්ත්වය විසින් නිර්මාණය කර ඇති අභියෝගයන්ට මුහුණ දීම සඳහා 1980 අංක 26 දරණ ආහාර (සංශෝධන) පනතේ සහ 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතේ ප්‍රතිපාදන ප්‍රමාණවත්වේද නැද්ද යන්න පිළිබඳව විමසන්න.

(ලකුණු 25)

4. පහත සිදුවීම්වලින් පැන නගින නෛතික බලපෑම් සාකච්ඡා කරන්න.

a) මහින්ද විසින් රේඛනය කළ සහ අත්සන් කළ හිස් චෙක්පතක් නාමල්ට ලබා දුන්නේ ඔහුගේ කාර්යාලයේ රු. 100,000/- ක විදුලි බිල්පතක් ගෙවීමට භාවිත කරන ලෙස දක්වමිනි. නාමල් එය භාවිත කරන ලද්දේ ඔහුගේ නිවස අලුත්වැඩියා කිරීම සඳහා රු. 1,000,000/- ක මුදලක් ගෙවීමට ය.

(ලකුණු 8)

b) කසුන් විසින් යොහාන්ගේ වාසියට ලියන ලද රු. 25,000/- වටිනා බිල්පතක් යොහාන් විසින් හිස් අත්සනක් යෙදීමෙන් පසු අස්ථානගත විය. බිල්පත සොයා ගත් කැලුම්, කසුන්ට එය ඉදිරිපත් කර මුදල් ලබා ගත්තේ ය.

(ලකුණු 8)

c) සජිත් විසින් ණයක් ගෙවීම සඳහා මෙරිට් බැංකුවේ චෙක්පතක් අරුණගේ වාසියට රේඛනය කළේය. අරුණ චෙක්පත රේඛනය කිරීමෙන් පසු පිටසනක් යොදා රසිකට එය ලබා දුන්නේ ඔහුගෙන් ලබා ගත් ලිපි ද්‍රව්‍ය වෙනුවෙනි. රසික වින්ඩ් බැංකුවේ පිහිටි ඔහුගේ ගිණුමේ චෙක්පත තැන්පත් කළ අතර වින්ඩ් බැංකුව රැස් කරගත් මුදල් අත්වැරදීමකින් වෙනත් අයෙකුගේ ගිණුමෙහි තැන්පත් කර ඇත.

(ලකුණු 9)

5. “ ගැණුම්කරු මුදල් ගෙවීම නම් වන ඔහුගේ මූලික වගකීම පැහැර හරින අවස්ථාවක දී, ඇත්තෙන්ම විකිණුම්කරුට ගිවිසුම සම්බන්ධයෙන් පුද්ගලික ප්‍රතිකර්ම පවතින නමුත්, විකිණුම්කරුට මෙම ප්‍රතිකර්ම ගැනීමට බල කෙරුණේ නම් ඔහුගේ තත්ත්වය බොහෝ ආකාරයන්ගෙන් අසතුටුදායක වනු ඇත.”

*Atiyah’s Sales of Goods,* **John N Adams and Hector Macqueen (Twelfth Edition)2010**

ශ්‍රී ලංකාවේ භාණ්ඩ විකිණීමේ නීතිය ඇසුරෙන් ඉහත ප්‍රකාශයේ වලංගුතාවය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. නඩු තීන්දු ඇසුරෙන් ඔබගේ පිළිතුර සනාථ කරන්න.

(ලකුණු 25)

****** හිමිකම් ඇවිරිණි *****